www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බ්‍රසල්ස්හි යුරෝපා සංගමයේ සමුලුව
# යුරෝපීය ආන්ඩු නායකයන් බැංකුවලට හිස නමයි

## EU summit in Brussels
## European heads of government bow to banks

**2009 ජූනි 26**
**පීටර් ෂ්වාට්ස් විසිනි**

ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය යලි හටගැනීම වලක්වනු වස් සමපේක්ෂකයන්ගේ කටයුතු පාලනය කර මූල්‍ය වෙලඳපොලවල් නියාමනය කරන බවට වසරක් තිස්සේම ප්‍රමුඛ යුරෝපීය දේශපාලඥයින් විසින් පොරොන්දු දී තිබේ. අවසානයේදී දැන් කන්ද විලිලා මී පැටවෙකු බිහිකර ඇත. සතියකට පෙර බ්‍රසල්ස්හි පැවති ඔවුන්ගේ සමුලුවේ දී යුරෝපීය රාජ්‍ය හා ආන්ඩු නායකයන් විසින් එකඟවූ නියාමනය, ඒ වෙනුවෙන් කැපවීමට පොරොන්දු නොවූ එක්සත් ජනපදය විසින් ක්‍රියාත්මක කර තිබෙන නියාමනයටත් වඩා දුබල ය.

අනතුරු ඇඟවීම් හා යෝජනා ප්‍රසිද්ධියට පත්කරන ''යුරෝපීය පද්ධතිමය අවදානම් මන්ඩලයක් (ඊඑස්ආර්බී)'' සැලසුම් කල ද කිසිදු යෝජනාවක් ඉදිරිපත්කර හෝ ක්‍රියාත්මක කර නැත. ඊට අමතරව දැනට පවත්නා අධිකාරයන් හා කමිටු එකිනෙක සමඟ වඩාත් සමීපව සම්බන්ධ කල යුතු විය. යුරෝපයේ ද ගෝලීයව ද ක්‍රියාත්මක වන බැංකු ජාතික නිරීක්ෂන අධිකාරයන් අතෙහි තැබිය යුතු විය.

බැංකුවල හා ආරක්ෂිත අරමුදල් පිලිබඳ නියාමන කටයුතු මඳ වශයෙන් දැඩිකල යුතු වුව ද එක්සත් ජනපදයට සමාන අයුරින් යුරෝපය ද ලෝක පරිමාන මූල්‍ය අර්බුදය මුදාහල එම වගකීම් විරහිත හා රහසිගත සමපේක්ෂනයට දිගටම අවකාශ සලසනු ඇත. බැංකුවලට ඔවුන්ගේ අසම්මත නය, අධි අවදානමකින් යුත් නය හුවමාරු හා අනෙකුත් තරයේම සමපේක්ෂනාත්මක මූල්‍ය ගොනු දිගටම පවත්වාගෙන යාමට හැකිවනු ඇත. හරියට ම කුමන වර්ගයේ මූල්‍ය කටයුතු වලට ඉඩදිය යුතු යන්න තීරනය කරන අධිකාරියක් නොපවතිනු ඇත.

බැංකු තම ශේෂපත්‍ර වලින් නය ගොනු මොනම නියාමනයකින් හෝ බොහෝවිට ස්වාධීනවූ, විදේශ මූලාශ්‍ර වෙත පිටමං කිරීම හා ඒවා බදු නිදහස සහිත තැන්වෙත මාරුකිරීම දිගටම සිදුකරනු ඇත. මෙහි අර්ථය, ඔවුන්ගේ නිල ශේෂපත්‍රවල නොපෙන්වන බිලියන් ගනන් වත්කම් සඟවා තැබීමට බැංකු වලට ඉඩ සැලසෙන බවයි. එවන් භාවිතයන් දැනටමත් තුඩුදී ඇත්තේ අලාභයන් බිලියන සිය ගනන් දක්වා ඉහල නැගීමටය. ජර්මනියේ රාජ්‍ය බැංකු ගනනාවක් හා හයිපෝ දේපල සමාගම ඉන් වඩාත් කැපී පෙනෙයි.

''මූල්‍ය ආයතනවල අඩක් සැඟවුනු ව්‍යාපාරික කටයුතුවලින් තථ්‍ය වශයෙන්ම ඉවත්වීමක් සිදු නොවනු ඇත'' යන්න ''බන්ධනයෙන් මුදාහල භූතයා'' යන සිරස් තලයෙන් යුත් ප්‍රකාශයක් තුල සුදෙව්ෂේ සේතුන් පුවත්පත බැස ඇති නිගමනයයි. ''එහි ප්‍රතිපලයක් ලෙස ඊලඟ අර්බුදය, නැතහොත් ඊලඟ කඩාවැටීම පූර්ව සැලසුම්ගතය.''

ජූනි මස ආරම්භයේදී ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල්, ඩොලර් ට්‍රිලියන ගනනක් එක්සත් ජනපද මූල්‍යායතනවලට පොම්ප කිරීම හා ජාත්‍යන්තර මූල්‍ය වෙලඳපොලවල් සඳහා නව රෙගුලාසි පැනවීමට පෙර, මූල්‍ය වෙලඳපොලවල් මත සිය ග්‍රහනය යලි තදකර ගැනීමට ඒවාට ආධාර කිරීම පිලිබඳව, ඇමරිකානු ආන්ඩුව දරුනු ලෙස විවේචනය කර තිබුනි. කෙසේ වෙතත් දැන් යුරෝපය තුල ද මූල්‍යායතනවල අනාගත ව්‍යාපාරික කටයුතු පිලිබඳ බලාපොරොත්තු හා ලාභ තීරනය කිරීමේදී, එය සිදුකෙරෙන නීති නියාමයන් තීන්දු කෙරෙන්නේ මූල්‍ය අවශ්‍යතා හා පෙලඹවීම් වලට අනුව බව පැහැදිලිය.

සියල්ලටත් වඩා, යුරෝපයේ විශාලතම මූල්‍ය මධ්‍යස්ථානය ලෙස ලංඩන් නගරයේ තත්ත්වය ආරක්ෂා කර ගැනීමේ අභිලාෂයෙන් ක්‍රියාකරන බ්‍රිතාන්‍ය ආන්ඩුව, කිසිදු අර්ථභාරී නව නියාමනයකට විරුද්ධ වෙයි. එහෙත් ජර්මානු හා ප්‍රන්ස ආන්ඩු ද, සිය රටවල මූල්‍ය කතිපයාධිකාරින්ට මුහුනදීමට අකමැත්තක් දක්වති. ව්‍යසනයට වගකිවයුතු එකදු මූල්‍ය සමාගමකට හෝ විරුද්ධව ක්‍රියා නොකර ම, අර්බුදයෙන් බැංකු බේරා ගැනීම සඳහා බදු

ගෙවන්නන්ගේ බිලියන සිය ගනන් මුදල් එම ආන්ඩු දෙක විසින් ම පරිත්‍යාග කොට තිබේ.

දැන් ඔවුන්, මොනම පුලුල් නියාමනයක් හෝ ''තරගකාරිත්වයට අවාසියක්'' ලෙස සලකන අතර, සිය එදිරිවාදීන්ගේ වියදමෙන් අර්බුදය විසඳ ගැනීමේ උත්සාහයක නිරත වෙයි. එහි ප්‍රතිපලය යුරෝපය තුල ආතතීන් තියුනු ලෙස ඉහල නැඟීමයි. යුරෝපීය මහ බැංකුවේ අධ්‍යක්ෂ මන්ඩල සාමාජිකයෙක් වන ලොරෙන්සෝ බිනී ස්මාගි, මූල්‍ය වෙලඳපොලවල් නියාමනය කිරීම පිලිබඳව මිලාන්හි පැවති සමුලුවක් අමතමින් මෑතකදී අනතුරු ඇඟවූයේ ''ප්‍රතිසංස්කරනවල හදිසි භාවය පිලිබඳව පැවති අවධානය ගිලිහී යෑමේ අනතුර හා ජාතිකවාදී ප්‍රවනතා මෙන්ම ආයතනික ඊර්ශ්‍යාව යලි හිස ඔසවන බව ද දැකගත හැකිය'' යනුවෙනි.

මෙම අර්බුදය අතරතුර යුරෝපීය සංගමය හා එහි ආයතන, යුරෝපයේ අතිශය බලගතු මූල්‍ය අවශ්‍යතාවන්හි විධායක හස්තය ලෙස විවෘතව ම වැඩ කරමින් ද එම ක්‍රියාවලිය තුලදී පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රඥප්තීන් විකාරයක් බවට පත්කරමින් ද සිටිති. මෙම ප්‍රවනතා දෙකම බ්‍රසල්ස් සමුලුව තුල අංගලක්ෂිතව තිබුනි. යුරෝපීය සංගම් මූලස්ථානයේ පස්වෙනි මහලෙහි විශේෂඥයන් එක්ව මෙම ශරත් ඍතුවේ මුල භාගයේ පමන නීතිගතවනු ඇති මූල්‍ය වෙලඳපොලවල් හැසිරවීමේ රෙගුලාසි සාකච්ඡා කල අතර, තට්ටු දෙකකට ඉහලින් ආන්ඩු නායකයෝ, අයර්ලන්ත ඡන්දදායකයන් විසින් පරාජයට පත්කල ලිස්බන් සම්මුතිය ඉදිරියට තල්ලු කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරමින් සිටියහ.

යුරෝපීය ජනතාව තුල යුරෝපීය සංගමය කෙරෙහි විරුද්ධත්වය වැඩෙමින් හා වඩාත් එලිමහනට පැමින තිබෙන අතර, එහි ආන්ඩු නායකයින් තම අභිමතය කුමන හෝ විරුද්ධ පාර්ශවයකට එරෙහිව යෙදවීමට, පෙර නොවූ විරූ නිර්ධයභාවයකින් යුක්තව, උත්සාහ දරමින් සිටී.

බ්‍රසල්ස් සමුලුවට යන්තම් දින දහයකට පෙර යුරෝපා මැතිවරනයේ සහභාගිත්වය සියයට 43 ක තරම් ඓතිහාසික පහල මට්ටමකට ඇද වැටුනි. බොහෝවිට දක්ෂිනාංශික ස්වභාවයක් ගත් යුරෝ සංගමයට විරුද්ධ පක්ෂ, රටවල් ගනනාවක දී සහයෝගය වැඩිකර ගැනීමට සමත් විය. මැතිවරන ප්‍රතිපලය පොදුවේ අර්ථ ගැන්වුනේ යුරෝපා සංගමයට හා එහි ව්‍යාපාර ගැති නැඹුරුවට පලවූ පුලුල් විරුද්ධත්වයක සලකුනක් ලෙසය. කෙසේ වෙතත් මෙම විරෝධයට හේතු විමසා බැලීම හා ඡන්දදායකයන්ගේ කැමැත්තට හිස නැමීම වෙනුවට ආන්ඩු නායකයෝ වරු ගනන් වාද විවාද කලේ, වංචනික ලෙස ඡන්දදායකයන් පසු බැස්සවීම සඳහා නීතියේ ඇති කල යුතු නව වෙනස්කම් පිලිබඳව ය.

ලිස්බන් සම්මුතිය සකස් කරනු ලැබුවේ, ප්‍රන්සයේ හා නෙදර්ලන්තයේ පවත්වන ලද ජනමත විචාරන වලින් පරාජයට පත්වූ, යුරෝපීය ව්‍යවස්ථාව සඳහා ආදේශකයක් ලෙසය. ඉන්පසු යුරෝපීය දේශපාලකයන් මවිතයට පත්කරමින් වසරකට පෙර අයර්ලන්ත ඡන්දදායකයෝ ලිස්බන් ප්‍රඥප්තිය පරාජයට පත්කලහ. එවන් ප්‍රතික්ෂේප වීමක් පිලිබඳ බිය නිසා අනෙක් බොහෝ රටවල දී ඡන්දය පැවැත්වීමට ඉඩ ලබාදී නැත. කෙසේ වෙතත් යුරෝපා සංගමයේ සාමාජික රටවල් 27 ම එකඟත්වයකින් තොරව ප්‍රඥප්තිය නීතිය බවට පත්වන්නේ නැත. අයර්ලන්තය සමඟ පෝලන්තය හා චෙකොස්ලොවේකියාව ද එය අනුමත කර නැති අතර, ජර්මනියේ දී ප්‍රශ්නය තීන්දු කෙරෙන්නේ, ප්‍රඥප්තියට එරෙහිව ගොනුකල අභියාචනයක විනිශ්චය ප්‍රකාශයට පත්කිරීම සඳහා, රටේ ව්‍යවස්ථාදායක අධිකරනය ජූනි මාසයේදී රැස්වීමෙන් අනතුරුව ය.

ලිස්බන් ප්‍රඥප්තිය පිලිබඳ අයර්ලන්තයේ දෙවන ජනමත විමසුම ඔක්තෝබර් මස මුලදී පැවැත්වීමට නියමිතව ඇත. දෙවන වරට ද එය අසාර්ථක වීම වලක්වාගැනීමේ අරමුනෙන් බ්‍රසල්ස් සමුලුව, යුරෝ සංගමයේ විශේෂයෙන්ම දක්ෂිනාංශික විරුද්ධවාදීන් සැනසීම ඉලක්ක කරගත් සහන ගනනාවක් සඳහා එකඟ වී ඇත. අයර්ලන්තයේ ගබ්සාවන් තහනම් කිරීමට පනවා ඇති දැඩි නීතිරීති වලට අභියෝග කිරීමට යුරෝව උත්සාහ නොකරන බවට සමුලුව එකඟ විය. එය අයර්ලන්ත බදු ප්‍රතිපත්තියට ඇඟිලි නොගසනු ඇත. එහි පහත් බදු අනුපාතික නිසා සැක කටයුතු බැංකු ගනනාවක් ආකර්ෂනය කර ගැනීමට අයර්ලන්තයට හැකි වී තිබේ. එරට මැදහත් මිලිටරි තත්ත්වය ද පිලිගනු ඇත.

කෙසේ වුවත් මෙම සහන ලිස්බන් ප්‍රඥප්තිවට ලිඛිතව ඇතුලත් නොකරනු ඇත. මක්නිසාද යත් ඒ මගින් සමස්ත අනුමත කිරීමේ ක්‍රියාවලිය ම යලි සලකා බැලීම අවශ්‍ය කරවන බැවිනි. එය බොහෝ විට ප්‍රඥප්තියේ අවසානයට තුඩු දිය හැකිය. ඒ වෙනුවට මෙම සහන, අතුරු විධි විධානයක් තුලට ඇතුලත් කරන අතර, එහි නීතිමය වලංගුභාවය වෙනත් අවස්ථාවක තීරනය කරනු ඇත. විශේෂඥයින් තව දුරටත් පෙන්වාදී ඇත්තේ මෙම සහන ''බොහෝ දුරකට සංකේතාත්මක ස්වභාවයේ ඒවා'' බවත් ''සංගමය තුල දැනටමත් පවත්නා නීතිය සනාථ කිරීමක් පමනක් සිදුවන'' බවත් ය. (නිච් සූර්චෙර් සේතුන්)

වෙනත් වචනවලින් කිවහොත් සමස්ත ව්‍යායාමය ම, ලිස්බන් ප්‍රඥප්තියට මොනම වැදගත් සංශෝධනයක් හෝ ඇතුලත් කර නොමැති තත්ත්වය යටතේ, අයර්ලන්ත ඡන්දදායකයන් ගොනාට ඇන්දවීම අරමුනු කර ගත් පිළිකුල් සහගත උප්පරවැට්ටියකි.

බ්‍රසල්ස් සමුලුව තුල කැපී පෙනුනු තවත් මාතෘකාවක් වූයේ, යුරෝපීය සංගම් කොමිසමේ සභාපති මැනුවෙල් බරෝසෝගේ කාලය තවත් පස් වසරකින් දීර්ග කිරීමයි. මෙම ප්‍රශ්නය මුල්කරගෙන සිදුවන අත යට ගනුදෙනු, යුරෝපීය සංගමය ක්‍රියාත්මක වන ස්වභාවය පෙන්නුම් කරයි.

මෙම ශරත් සෘතුවේදී අවසන් වීමට නියමිත බරෝසෝගේ නිල කාලය දීර්ග කිරීමට, සමුලුවට පෙර ම ජර්මානු චාන්සලර් මර්කෙල් හා ප්‍රන්ස ජනාධිපති නිකොලායි සාකෝසි එකගත්වය පලකොට තිබුනි. ඉන් පසුව තිරයට පිටුපසින් ඇති කර ගත් එකගතා මත, අනෙකුත් සියලු ම රාජ්‍ය නායකයන් එක පෙලකට ගෙන ඒමට ඔවුන් සමත් විය. ''සයිප්‍රසයේ කොමියුනිස්ට්වාදීන්ගේ සිට ඉතාලියේ බර්ලුස්කෝනි දක්වා'' නායකයන් 27 දෙනාම බරෝසෝට සිය සහාය පල කලහ.

ජර්මානු ෆැස් පුවත් පතට අනුව බරෝසෝ මෙතරම් ආකර්ශනීය වූයේ ඔහු සතු වන ''සැලකිය යුතු අනුගතවීමේ හැකියාව'' නිසාය. හිටපු මාවෝවාදියෙකු හා දැන් ප්‍රමුඛ කොන්සවේටිව් දේශපාලඥයෙකු වන ඔහු, බලගතු ම මූල්‍ය හා ව්‍යාපාරික අවශ්‍යතාවන්ගේ පෙලඹවීම් වලට අනුගතවීමෙහි ලා ඔහු සතු හැකියාව ගැන ප්‍රසිද්ධියට පත්ව සිටියි.

ෆැස් පුවත්පත ඔහුගේ අසීමිත අවස්ථාවාදය මෙසේ ගෙනහැර දැක්වීය. ''නිදහස් වෙලඳපොල පිලිවෙත තවමත් යුරෝපය තුල දැල්වෙමින් තිබුනු දින වල ඔහුගේ මඟ පෙන්වීම යටතේ කොමිසම, තනි වෙලඳපොලේ එන්ජිම විය. පසුව ගෝලීයකරනය එහි ආකර්ශනීය නොවන පැත්ත පෙන්වීමට පටන් ගත් පසුව ඔහු, සමාජ නීති පද්ධතියක් සොයා ගත් නමුත්, යුරෝපා සංගමයට එවන් ප්‍රශ්න පිලිබඳව මැදිහත් වීමට වැඩි ඉඩකඩක් නොතිබුනි. පසුව, මූල්‍ය අර්බුදය හමුවේ ඔහුගේ රාජකාරිය බැංකු බේරාගැනීමත් මෝටර් රථ සමාගම් වලට සහායවීමත් බවට පත්වූ විට, ඔහුගේ කොමිසමේ නිලධාරීන්ට අනුන්ගේ සැපතට බාධා කිරීමට අවශ්‍ය නොවීය.''

බරෝසෝගේ නිල කාලය දීර්ග කිරීම, යුරෝපීය පාර්ලිමේන්තුව ද තමන්ට තැනක් අවශ්‍ය බව කියා සිටීමත් සමඟ අර්බුදයට ගියේය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු කන්ඩායමේ සභාපති මාර්ටින් ෂූල්ට්ස් හා හරිත පාර්ලිමේන්තු කන්ඩායමේ සභාපති ඩැනියෙල් කෝන් බෙන්ඩිට් යන දෙදෙනා ම, බරෝසෝ අපරිනත ආකාරයකට පත්කිරීම කෙරෙහි සිය විරෝධය පලකර තිබුනි. ලිස්බන් ප්‍රඥප්තිය බලාත්මක කිරීමට අපේක්ෂිත ශරත් සෘතුව තෙක්, තීරනය කල් දැමීමට ඔවුන්ට අවශ්‍ය විය. එවිට හුදෙක් අපේක්ෂකයාට ඡන්දය දීමට පමනක් නොව කෙමිසමේ සභාපති නම් කිරීමට සහභාගී වීමේ අයිතිය ද යුරෝපීය පාර්ලිමේන්තුවට හිමිවේ.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හෝ හරිත යන දෙපාර්ශවයෙන් කවරෙකුට හෝ සැබවින්ම බරෝසෝ කෙරෙහි කවර අව්‍යාජ විරුද්ධත්වයක් වත් ඇත්තේ නැත. ''ඔහු සිය නව කොමිසම සඳහා පත්කිරීම් සලකා බලන විටත්, ඔහුගේ දෙවන නිල කාලයේ ප්‍රතිපත්ති වැඩපිලිවෙල සකස්කරන විටත්, ඔහුගෙන් සහන ලබාගැනීමේ කෑදර කමෙන් බොහෝ දුරට බරෝසෝ මහතා කෙරෙහි විරුද්ධත්වය පැන නගින බව පෙනී යයි.'' ඒ බ්‍රිතාන්‍යයේ පලවන *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත් පතෙහි ප්‍රකාශයකි. වෙනත් වචන වලින් කිවහොත් ෂූල්ස් හා කෝන් බෙන්ඩිට් සඳහා ප්‍රධාන ප්‍රශ්නය වන්නේ ප්‍රතිපත්ති පිලිබඳ මූලික මතභේද වලට වඩා තනතුරු හා බලපෑම් කලහැකි තත්ත්වයයි.